ලංකාවට Online

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

(නව විෂය නිර්දේශය)

**ii පත්‍රය**

ඒකකය - 01

## සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය, විකාශනය, එහි ශාස්ත්‍රීය පසුබිම හා ඉගෙනීමෙහි වැදගත්කම

නව ප්‍රශ්න සැකසුම - **සංජීව ක්‍රිෂාන්ත රණසිංහ**

කාලය පැය තුනයි.

Sanjeewa Krishantha Ranasinghe

**01.**

(i) ජන සන්නිවේදනය පිළිබඳ ඩෙනිස් හා ඩිෆ්ලූවර්ගේ නිර්වචනය ලියා දක්වන්න.

(ii) වර්තමාන ජන සමාජයේදී සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයෙහි පුළුල් වීමක් දක්නට ලැබෙන්නේ ඇයි?

(iii) ශ්‍රී ලංකාවේ සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන සංවර්ධනය හා එය ඉගැන්වීමෙහි වැදගත්කම පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(iv) යුනෙස්කෝ සංවිධානයේ ගෲන්වල්ඩ් ප්‍රකාශනය ඉදිරිපත් කිරීම වර්තමාන සමාජයේ මාධ්‍ය සාක්ෂරතාවයට හා මාධ්‍ය විචාරයට ප්‍රබල පිටිවහලක් විය. මේ පිළිබඳ ඔබේ අදහස් ගොනු කරන්න.

**02.**

(i) මාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ අවශ්‍යතාවයන් ශ්‍රී ලංකාව තුළ මූලික වශයෙන් ඉස්මත වන්නට හේතුව කුමක්ද?

(ii) මාධ්‍ය අධ්‍යයනයේදී සියලුම මාධ්‍ය යන්නට අයත් වන්නේ මොනවාදැයි දක්වා, මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ යුරෝපා කොමිසමේ නිර්වචනය ලියන්න.

(iii) සන්නිවේදන විෂය පිළිබඳ ශාස්ත්‍රීයව අධ්‍යයනය කිරීමේ වැදගත්කම කරුණු **දෙකක්** ඔස්සේ පැහැදිලි කරන්න.

(iv) පෙන්සිල්වේනියානු විශ්ව විද්‍යාලයේ ප්‍රචණ්ඩ ක්‍රියා සහිත වැඩසටහන් නිසා ළමුන් තුළ ඇති වන ප්‍රධාන වෙනස්කම් **තුනක්** පෙන්වා දුන්නේය. ඒවා හඳුන්වන්න.

**03.**

(i) කැළණි විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදන පීඨය ආරම්භ කිරීමේදී ප්‍රමුකත්වය ගත් විද්වතුන් **හතරදෙනෙකු** නම් කරන්න.

(ii) සන්නිවේදනය පිළිබඳ නිර්වචන **දෙකක්** ලියා එය ඉදිරිපත් කළ විද්වතුන් සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට කළ සේවාවන් **එක** බැගින් දක්වන්න.

(iii) අව්ධිමත් සන්නිවේදනය සතු ලක්ෂණ **තුනක්** විස්තර කරන්න.

(iv) සන්නිවේදනය හා මාධ්‍ය විෂය හැදෑරීමේ අවශ්‍යතාවය කරුණු **හතරකින්** දක්වා විස්තර කරන්න. (උදාහරණ අවශ්‍යයයි)

**04.**

(i) ජන සන්නිවේදනයේ ලක්ෂණ **හතරක්** ලියන්න.

(ii) මාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයනයේදී හඳුනාගත හැකි නව මාධ්‍ය හා සාම්ප්‍රදායික මාධ්‍ය ක්‍රම **හතර** බැගින් දක්වා සාම්ප්‍රදායික මාධ්‍ය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) සන්නිවේදන අධ්‍යයන විෂය ශාස්ත්‍රීය විෂයක් ලෙස වර්තමාන තත්ත්වයට පත්කිරීමට දායකවුණු විද්වතුන් **දෙදෙනෙක්** පිළිබඳ විස්තරයක් ලියන්න.

(iv) ශ්‍රී ලංකාවට සන්නිවේදන විෂය හඳුන්වා දීම පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සකස් කරන්න. (වර්ෂද සහිතව)



*"ඔබ නොකියවූ රොමැන්ටික් කවිය"*
සංජීව ක්‍රිෂාන්ත රණසිංහ

රොටරි - නුගේගොඩ / සියැස්රෝ - රත්නපුර / වික්ටරි - බලංගොඩ / සක්සස් - පැල්මඩුල්ල

**05.**

(i) ෂැනෝන් හා වීවර්ගේ නිර්වචනය ලියන්න.

(ii) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සන්නිවේදන විෂය ඉගැන්වෙන විශ්ව විද්‍යාල **හතරක්** නම් කර, ඒවා තුළ ක්‍රියාත්මක පාඨමාලා පිළිවෙලින් දක්වන්න.

(iii) අ.පො.ස උසස් පෙළට නියමිත සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය කොටස් **දෙක** ඒවාට අදාළ විෂය කරුණු **හතර** බැගින් ගෙන විස්තර කරන්න.

(iv) ඔබ දන්නා නූතන සන්නිවේදන ආකෘතියක් ඇඳ එය ඇරිස්ටෝටල් ආකෘතියේ මූලිකාංග සමඟ සංසන්දනාත්මකව විවරණයක් කරන්න.

Sanjeewa Krishantha Ranasinghe

**070 31 98 591 / 077 45 17 280**

**070 31 98 591**

**Sanjeewa Krishantha** **Sanjeewa Krishantha**



*"ඔබ නොකියවූ රොමැන්ටික් කවිය"*

*සංජීව ක්‍රිෂාන්ත රණසිංහ*

**රොටරි - නුගේගොඩ / සියැස්රෝ - රත්නපුර / වික්ටරි - බලංගොඩ / සක්සස් - පැල්මඩුල්ල**